## 2022 ජුනි මස 20 දින පැවති නව ආයෝජන,ආදායම් ප්‍රවර්ධන,ඉඩම් හා දේපල නිරවුල් කිරීමේ ස්ථාවර කමිටුව

**කමිටු සාමාජිකයන්**

1. නීතිඥ ප්‍රේමසිරි හෙට්ටිආරච්චි මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සභාපති
2. නීතිඥ රංජිත් රාජකරුණා මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
3. නලින් සිරිවර්ධන මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
4. ඩී.ජී.ප්‍රේමදාස මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
5. නීතිඥ නිර්මලි ප්‍රියදර්ශනි මැතිතුමිය - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
6. කේ.ඒ.ඉන්ද්‍රාණි මැතිතුමිය - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික

**නොපැමිණීම**

1. නීතිඥ ප්‍රේමසිරි හෙට්ටිආරච්චි මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සභාපති
2. ඩී.ජී.ප්‍රේමදාස මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික

**නිලධාරි**

1. ජයනි රාජකරුණා මිය - නාගරික ගණකාධිකාරි
2. කේ.ජී.එන්.සී.බණ්ඩාර මහතා - නාගරික ඉංජිනේරු
3. එන්.පී.කේ.රණසිංහ මිය - පරිපාලන නිලධාරි
4. ඩී.එන්.ප්‍රියන්ති මිය - නීති නිලධාරි
5. එම්.ජී.සී.සනත් මහතා - ප්‍රධාන ආදායම් පරීක්ෂක
6. ඩී.එම්.මල්ලිකා මිය - කළමනාකරණ සේවා නිලධාරි (පාලන)
7. ඩී.එම්.අරුණ රන්දෙනිගම මහතා - මහජන පොල පාලක
8. ජේ.බී.මධුෂා ගයත්‍රී මෙනවිය - විෂය ලිපිකරු

**නිලධාරි නොපැමිණී**

1. එන්.පී.කේ.රණසිංහ මිය - පරිපාලන නිලධාරි
2. ඩී.එන්.ප්‍රියන්ති මිය - නීති නිලධාරි

අද දින කමිටු සභාපති නොපැමිණීම හේතුවෙන් කමිටු සාමාජික නාගරික මන්ත්‍රී නීතිඥ නිර්මලි ප්‍රියදර්ශනි මැතිතුමියගේ යෝජනාවෙන්, නාගරික මන්ත්‍රී නලින් සිරිවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් නාගරික මන්ත්‍රී නීතිඥ රංජිත් රාජකාරුණා මැතිතුමා නව සභාපති ලෙස පත්කරන ලදි. නව සභාපති ලෙස නාගරික මන්ත්‍රී නීතිඥ රංජිත් රාජකරුණා මැතිතුමා අද දින න්‍යාය පත්‍රය අනුව කමිටුවේ කටයුතු ඉදිරියට පවත්වා ගෙන යන ලදි.

1. 2022.04.21 වන දින අංක 08 යටතේ වකුගඩු රෝහල ඉදිරිපිට තබා ඇති කන්ටේනර් පෙට්ටියට අදාල ව්‍යාපාරය සම්බන්ධ සහා සම්මතවී ඇති එම යෝජනාව. රෝහල ප්‍රදේශයේ තබා ඇති කන්ටේනර් පෙට්ටිය සඳහා මාසිකව රු.10,000.00 ක මාසික ගාස්තුවකට යටත්ව ලිඛිත ගිවිසුමකට ඇතුලත්විය යුතු බවත්, තවද මාස 06 ක ඇප මුදලක් ලබා ගැනිමට තීරණය විය.

2. මාදුවගේ එන්ටර්ප්‍රයිසස් හා ලේසර් එන්ටර්ටේට්මන්ට් ආයතනය විසින් යොමු කරන ලද මෛත්‍රීපාල සේනානායක මාවත නගර සභා වටරවුම අසල විද්‍යුත් දැන්වීම් පුවරුව සවිකිරිම පිළිබඳ ලේඛන පිළිබඳව සාකච්ජා කරන ලදි. එහිදී දැනටමත් මෙය සභාව තීරණයක් අරගෙන අනුමත කර ගෙන ඇති බව කරුණු හෙළිවිය. එහෙත් අදාල පාර්ශව සමග ගිවිසුම් ගතවිමේදි ඒ සඳහා අය කර ගත යුතු මුළු මුදල් සහ සභාවට අය කර ගන්නා මුදල් පිළිබඳව ස්ථිර වශයෙන් තීරණයක් ලබා ගෙන එය ගිවිසුමට ඇතුලත් කල යුතු බවට කමිටුව තීරණය කරන ලදි. එමෙන්ම විශේෂයෙන් සභාවට ආදායමක් ලැබෙන ආකාරයට මාසිකව යම් මුදලක් අය කර ගැනිම සුදුසු බවටත් තීරණය කරන ලදි. (වගකිම - නාගරික ගණකාධිකාරි)

නීතිඥ රංජිත් රාජකරුණා,

නාගරික මන්ත්‍රී / කමිටු සභාපති (වැඩ බලන),

නව ආයෝජන,ආදායම් ප්‍රවර්ධන,ඉඩම් හා දේපල නිරවුල් කිරිම පිළිබඳ ස්ථාවර කමිටුව,

මහා නගර සභාව,

අනුරාධපුර.